# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2290/13 - 2022 ජූලි මස 26 වැනි අඟහරුවාදා - 2022.07.26

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

එල්. ඩී. බී. 21/78 (XV)(බී)

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

21 වන වගන්තිය සමඟ කියවිය යුතු 27 (1) වන වගන්තිය යටතේ වන නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 27(1) වන වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, අධ්‍යාපන අමාත්‍ය, ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත වන මා විසින්, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නිර්දේශය මත, මේ නියමය මගින් ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලය පිහිටුවමින්, එකී පනතේ 21 වන වගන්තිය යටතේ සාදන ලද සහ (කලින් කල සංශෝධිත පරිදි වූ) 1986 සැප්තැම්බර් මස 26 වැනි දින අංක 420/25 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නියමයේ උපලේඛනය, එම උපලේඛනයේ I වන තීරයේ දැක්වෙන "කලා සහ සංස්කෘතික කටයුතු පීඨය" (2007 නොවැම්බර් මස 14 වන දින අංක 1523/16 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නියමයේ නිශ්චිතව දක්වා ඇති) යන අයිතමයට අනුරූපව උපලේඛනයේ II වන තීරයේ දැක්වෙන "13. දෙමළ අධ්‍යයන අධ්‍යයනාංශය" (2021 මාර්තු මස 22 වැනි දින අංක 2220/19 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නියමයේ නිශ්චිතව දක්වා ඇති) යන සටහනට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් සටහන එකතු කිරීම මගින් මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

"14. තොරතුරු තාක්ෂණ අධ්‍යයන අංශය."

**ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත,**
අධ්‍යාපන අමාත්‍ය.

2022 ජූලි මස 05 වැනි දින,
කොළඹ දී ය.

EOG 07-0135


*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*